(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **28.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 අප්‍රේල් 22 සිකුරාදා පූ.භා. 10.00** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** වරාය සහ නාවික අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා, සංචාරක අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** බලශක්ති අමාත්‍යතුමා සහ විදුලිබල අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා

ගරු **කපිල අතුකෝරල මහතා,** සුළු අපනයන වැවිලි භෝග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමිය

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** වතු නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමා සහ ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** වැවිලි රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** කාබනික පොහොර නිෂ්පාදන සහ දියුණු තාක්ෂණ කෘෂිකර්ම ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික භෝග වගා සහ ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,** පේෂ කර්මාන්ත හා දේශීය ඇඟළුම් නිෂ්පාදන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වයි. ජී. රත්නසේකර මහතා,** සමූපකාර සේවා, අළෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තෙ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** තරුණ හා ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **සම්පත් අතුකෝරල මහත්මිය**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **(වෛද්‍ය) සීතා අරඹෙපොල මහත්මිය**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ටිරාන් අලස් මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පැස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු විජේදාස රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී වලේගොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

**ගරු මධුර විතානගේ මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ජනාධිපතිවරයාගෙන් ලද සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2022 අප්‍රේල් මස 21 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

ගෝඨාභය රාජපක්ෂ

**2.කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"පසුපෙළ මන්ත්‍රීවරයන් විසින් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේදී දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය හේතුවෙන් පාර්ලිමේන්තුවේ රැස්වීම් පවත්වනු ලබන සෑම දිනකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් කිහිප දෙනෙකුට පමණක් එම ප්‍රශ්න ඇසීමේ අවස්ථාව සීමාවී තිබීම නිසා පාර්ලිමේන්තු ප්‍රශ්න ඉදිරිපත් කරනු ලබන අනෙකුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට සමානව එම ප්‍රශ්න ඇසීමේ අවස්ථාව නොලැබෙන බවට එකී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් පාර්ලිමේන්තුවේ සභා ගර්භයේදී මෙන්ම පෞද්ගලිකව මා වෙත යොමු කරන ලද ලිඛිත හා වාචික ඉල්ලීම් 2022.03.16 හා 2022.04.08 යන දිනවල පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම්වලදී විශේෂ අවධානයට යොමු කරන ලදී.

ඒ අනුව වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේදී නව ක්‍රමවේදයක් අනුගමනය කිරීම පිණිස මතු දැක්වෙන මාර්ගෝපදේශ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලද බව මෙම ගරු සභාවට දැනුම්දීමට කැමැත්තෙමි:—

එක් පාර්ලිමේන්තු රැස්වීම් දිනකදී වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 10 කට පමණක් සීමා කිරීම;

එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්න භාර දී ඇති අනුපිළිවෙළ අනුව පළමුවැනි ප්‍රශ්නයට ප්‍රමුඛතාවය ලබා දී පාර්ලිමේන්තුවේ රැස්වීම් පවත්වනු ලබන පළමුවැනි දිනයේදී මුලින්ම නම් සඳහන් මන්ත්‍රීවරයන් දහදෙනාගෙන් (10) එක් ප්‍රශ්නය බැගින් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම;

දෙවැනි දිනයේදී ඊළඟට නම් සඳහන් මන්ත්‍රීවරයන් දහදෙනාගේ (10) ප්‍රශ්න පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සහ අනෙකුත් දිනයන් සඳහාද ඒ ආකාරයෙන්ම වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම;

පිළිතුරු ලබා දීම සඳහා කාලය ඉල්ලා සිටින ලද ප්‍රශ්න අදාළ මන්ත්‍රීවරයාට ඊළඟට එළඹෙන අවස්ථාවට අදාළ පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනයේදී ඒ සඳහා යෝග්‍ය පරිදි ප්‍රමුඛතාවය ලබා දීම;

මෙම නව ක්‍රමවේදය 2022 මැයි මස පළමු පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දින සිට ක්‍රියාත්මක කිරීම."

**රැස්වීම තාවකාලිකව අත්හිටවීම**

පූ.භා. 10.30

පූ.භා. 10.50 වන තෙක් රැස්වීම තාවකාලිකව අත්හිටවන ලදී.

පූ.භා. 10.50

රැස්වීම යළිත් එක්රැස්වූයෙන් කථානායකවරයා මූලාසනාරූඪ විය.

**3. ලිපි ලේඛනාදිය පිළිගැන්වීම**: මහජන ආරක්ෂක අමාත්‍ය සහ සංචාරක අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, තරුණ හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ වාර්තා පිළිගැන්වීම :** "ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ වාර්තාව ප්‍රවාහන අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලදී.

පනත් කෙටුම්පත 2022 මැයි 04 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි නියෝග කරන ලදී.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2022 මැයි 04 බදාදා පූ. භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු උද්දික ප්‍රේමරත්න මහතා, ගරු වීරසුමන වීරසිංහ මහතා ස්ථිර කරමින් කරන ලද යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත නාගරික සංවර්ධන හා නිවාස කටයුතු අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**7. මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1):** ප්‍රවාහන අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ආ වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 සැප්තැම්බර් 17 දිනැති අංක 2245/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2):** ප්‍රවාහන අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 122, 122අ වගන්ති සහ VIIඅ කොටස සමඟ කියවිය යුතු, 237 වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ඔක්තෝබර් 29 දිනැති අංක 2251/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 3):** ප්‍රවාහන අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5, 19 සහ 20 වගන්ති සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අගෝස්තු 14 දිනැති අංක 2240/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා, ගරු කිංස් නෙල්සන් මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.54 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

**10. කල් තැබීම (අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින සිසුන් මුහුණ දෙන ගැටලු):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි මහජන ආරක්ෂක අමාත්‍ය සහ සංචාරක අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 5.14 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව 2022 මැයි 04 බදාදා පූ. භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.